නමෝ බුද්ධාය

දාහ නව වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05
මාසික ධර්ම සංග්‍රහය අංක: 186
ශ්‍රී. බු. ව. 2559 | 2015 දෙසැම්බර් 24 | උඳුවප් කළාපය

# මහ සඟ ගුණ මෙනෙහි කිරීම

හරගම ජාතික අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්ය අනුරාධපුර ශ්‍රී සාරානන්ද පරිවෙනාධිපති අධ්‍යාපනපති

**අතිපූජ්‍ය නෙළුවාකන්දේ සද්ධාණානන්ද නා හිමිපාණන් වහන්සේ විසිනි**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///

**යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා**
**චාත්තාරි එතානි යුගානි හොන්ති**
**තෙ දක්ඛිනෙය්‍යා සුගතස්ස සාවකා**
**එතෙසු දින්නානි මහප්ඵලානි**
**ඉදම්පි සංඝෙ රතනං පනීතං**
**එතෙන සච්චෙන සුවත්ථි හොතු**

පින්වතුනි

රතන සූත්‍රය අපේ බෞද්ධයින් අතර වඩාත් ප්‍රචලිතව තියෙන්නේ පිරිත් සූත්‍ර දේශනාවක් හැටියටයි. අපේ අටුවාචාරීන් වහන්සේලා බුද්ධ දේශනාවේ අතිශය වැදගත් සූත්‍ර තෝරාගෙන පිරිත් සූත්‍ර හැටියට දක්වා තියෙනවා. විශේෂයෙන් රතන සූත්‍රය බෞද්ධ නිවෙස්වල නිතර නිතර භාවිතා කෙරෙන සූත්‍ර දේශනාවක්. ජීවිතයේ හැම සම්මත මංගල අවස්ථාවක ම මෙම සූත්‍ර දේශනාව දේශනා කරවාගෙන ආශිර්වාද ලබා ගැනීමට අපේ බෞද්ධයන් අමතක කරනනේ නැහැ. අද මගේ ධර්ම දේශනාව සඳහා මාතෘකා කළේ රතන සූත්‍රයේ එන ඉහත සඳහන් ගාථා ධර්මය යි.

**පින්වත, මේ සූත්‍රය පුරාම ඇතුළත් වෙලා තියෙන්නේ බුද්ධ ධම්ම සංඝ කියන රතන සූත්‍රයේ ගුණයි. මේවා රත්න හැටියටයි සඳහන් වන්නේ, අපේ භාවිතයේ තියෙන වචනයක් තමයි "රතන" මැණික් වලට අපි ඒ නම භාවිතා කරනවා. ඒ වටිනා නිසයි.**

බෞද්ධයකු බුදුහාමුදුරුවෝ, ධර්මය, සංඝයා හැර වෙනත් වටිනා දෙයක් ඇත්තේ නැහැ. ඒ නිසා තමයි ඒ වස්තු තුනට රත්න කියන නම යොදල තියෙන්නේ. ලෝකයේ ඇති වටිනාම වස්තුව මොකක්ද කියලා ඇහුවොත් අපට දෙන්න පුළුවන් පැහැදිලි ම පිළිතුර තමයි. බුද්ධ රත්නය කියන එක. කපා ඔප කළ මැණික් වගේ බුදුහාමුදුරුවන්ගේ චරිතය කොයි පැත්තකින් බැලුවත්, බලන කෙනාට ආදර්ශයක් ගන්ට පුලුවන් වෙනවා. උන්වහන්සේ ගැන හිතන කෙනෙකුට සැනසිල්ලක් ඇති වෙනවා. උන්වහන්සේ දකින කෙනෙකුගේ හිත නෙත සැනසී යනවා. බුද්ධියේ උපරිම ඵලය ලබාගත් තැනැත්තා උන්වහන්සේයි. ඒ නිසා බුදුහාමුදුරුවෝ තරම් අගනා රත්නයක් ලෝකයේ තවත් නැහැ.

නව ලොව්තුරා ධර්මය නිර්මලයි. පිරිසිදුයි, සියලු කෙලෙස් නසා අමා මහ නිර්වාණය ලබාදීමට තරම් පැහැදිලි මාර්ගයක් ධර්මය තුළ තියෙනවා. ඒ නිසා ධර්මය උතුම් රත්නයක්

මාර්ගඵල ලාභී උතුම් මහා සංඝරත්නය ලෝ වැස්සන්ට දුක් නිවාරණය කොට සදා සැනසීම සඳහා මග කියා දෙන පිරිසයි. උන්වහන්සේ සුපටිපන්න යි. උජුපටිපන්න යි. සාමීචි පටිපන්න යි. මහා සංඝයා වහන්සේ අපට මේ ලෝකයේ ඇති උතුම් රත්නයක්.

පින්වත, රතන සූත්‍රයට ඇතුළත් කරල තියෙන්නේ මේ තෙරුවන් ගුණ යි. බුද්ධ කාලය වෙනකොට ඉන්දියාවේ හිටිය බොහොමයක් ශාස්තෘවරු කිව්වේ බොරුවට මවාගත් ගුණයක් ගැනයි. අපට මේ විදිහේ ගුණ තියෙනවා. මේ මේ විදියේ ප්‍රාතිහාර්ය පාන්ට පුලුවන් කියලා, ඔවුන් විශාල ප්‍රචාරයක් ගෙන ගියා. ඒ විතරක් නෙවෙයි මිනිස්සු මුලා කළා රතන සූත්‍රය දිහා බැලුවම එය බුදුහාමුදුරුවෝ මේ අසත්‍ය - මායාකාරයින්ට ඉගැන් වූ පාඩමක් වගෙයි පෙනෙන්නේ. මේ සෑම ගාථාවකින්ම මෙන්න බුදු කෙනෙකු ළඟ තියෙන ගුණය ධර්මයේ තියෙන ගුණය මේකයි. මහා සංඝයා වහන්සේගේ ගුණය මේ විදිහයි කියල පැහැදිව ඉදිරිපත් කරල තියෙනවා. මේක හරියට අභියෝගයක් කළා වගෙයි. විරුද්ධ වෙන කෙනෙකුට පුලුවනි. ඔය විදිහේ ගුණයක් කොහෙද තියෙන්නේ කියලා විරුද්ධ වෙන්න. ඒත් කිසිවෙක් විරුද්ධ වුණේ නැහැ. ඒ නිසා මේ සූත්‍රය එදා මිත්‍යාවෙන් බොරුවෙන් ජනතාව මුලා කොට ගුණවතතන් යයි කියා ගන්න පිරිසට අභියෝගයක් වුණා. ඒ විතරක් නෙමෙයි. මේක සත්‍ය ක්‍රියාවක්. මේ කියන කරුණු සත්‍ය නම් ඒ සත්‍යයෙන් සැපතක් යහපතක් වේවා. කියන ප්‍රාර්ථනය කෙරෙනවා. අදත් අපේ බෞද්ධ පිරිත් සූත්‍රයක් හැටියට මේ සූත්‍රය භාවිතා කරන්නේ මේ සත්‍ය ක්‍රියාව නිසයි.

පින්වත බුදුහාමුදුරුවන්ගේ නික්ලේශී හදවතින් පැනනැගුණු අදහස්වල, වචනවල පුදුම විදියේ බලයක් ගුණයක් තියෙනවා. රතන සූත්‍රයෙන් පෙන්වා දෙන්නේ

උන් වහන්සේගේම ශ්‍රී මුඛයෙන් තෙරුවන් ගුණ පිළිබඳව ඉදිරිපත් කළ සත්‍ය ක්‍රියාවයි. ඒ නිසා මේක මහා පුදුම විදිහේ බලයක් තියෙන සූත්‍ර දේශනාවක්.

මාතෘකා ගාථාවෙන් මේ ලෝකයේ වටිනා පුද්ගලයන් අට දෙනෙක් ගැන කියවෙනවා. මේ අට දෙනා යුගල වශයෙන් හතරකට බෙදලා තියෙනවා.

පින්වත ඒ තමයි සෝවාන් මග, සෝවාන් ඵලය, සෘදාගාමී මග හා ඵලය අනාගාමී මග හා ඵලය අනාගාමී ඵලය, අර්හත් මග හා අර්හත් ඵලය බුදුහාමුදුරුවෝ මේ අවස්ථා පුද්ගලයන් හැටියට දැක්කා

ආර්ය මහ සඟරුවන හා සම්මුති මහ සඟ රුවන වශයෙන් හාමුදුරුවරු දෙකොටසකට දැක්විය හැකිය. මග ඵල ලාභී උතුමන් වහන්සේගේ ආර්ය ගුණයට ඇතුළත් වෙනවා. කෙලෙස් නැති කිරීමට වීරිය කරන එහෙත් මාර්ග ඵල නොලබා සිටින හාමුදුරුවරු ගැනෙන්නේ සම්මුති මහා සංඝයාටයි.

පින්වත, අපව මේ සසරට බැඳලා තියෙන බැඳීම් දහයක් තියෙනවා. ඒවා දස සංයෝජන කියලා හඳුන්වන්නේ සක්කාය දිට්ඨි, විචි කිච්ඡා, සීලබ්බත, පරාමාස, කාමරාග, ව්‍යාපාද, රූපරාග, අරූපරාග, මාන, උද්දච්ච, අභික්ඛා, වශයෙනුයි. ඒවා දැක්වෙන්නේ මේවා ක්‍රමයෙන් විනාශ කිරීම තුළින් තමයි. සසර ගමන නවත්වන්නට පුළුවන් වන්නේ මගඵල ලබන හැම කෙනෙක්ම මේ සංයෝජන පිළිවෙලින් නැති කරන්නට ඕනෑ

රතන සූත්‍රයේම සක්කාය දිට්ඨි විචිකිච්චි තං ච සීලබ්බතංවා පියදත්ථි කිංචි ආදි වශයෙන් ඒ බැව් පෙන්වා තියෙනවා. ඕරම්භාගිය හා උද්ම්භාගිය වශයෙන් මේ සංයෝජන කොටස් දෙකකට පහ බැගින් බෙදා තියෙනවා. කෙනෙක් සෝවාන් වෙනවායැයි කියන්නේ මුලින් කියා ඇති සංයෝජන තුන මුළුමනින්ම නැති කිරීමයි. සකෘදාගාමී වීමේදී ඊළඟ සංයේජන දෙක තුනී වෙනවා. ඒවා නැති කිරීමෙන් අනාගාමී බවට පත් වෙනවා. පසුව දැක්වෙන සංයෝජන පහම සම්පූර්ණයෙන්ම නැති කිරීමෙන් තමයි අර්හත් ඵලයට පත්වන්නේ .

පිළිවෙලින් පඩිපෙළක් දිගේ නැග යනවා වගේ මේවා ක්‍රමයෙන් නැති කර දමන්නට ඕනෑ. මෙතෙක් ලොව පහළ වී තිබෙන කිසිම ආගමක මෙවැනි විධිමත් වැඩ පිළිවෙලක් උගන්වන්නේ නෑ. මේක විද්‍යාත්මක ක්‍රමයට එකඟයි. දාර්ශනික සම්ප්‍රදායට එකඟයි. එනිසාම හේතුඵල ධර්මයට එකඟයි වසර දහස් ගණනක් ගතවෙලාත් මෙහි අසත්‍ය බවක් වැරදි බවක් කාටවත් පෙන්වන්ට පුලුවන් වෙලා නෑ.

පින්වත බුදුහාමුදුරුවෝ මිනිසුන්ට සැලකුවේ නෑ. මිනිසුන් තුළ පවතින ගුණයටයි සැලකුවේ. ගුණයෙන් උතුම් වෙන්ට වෙන්ට මිනිසාගේ වටිනාකම වැඩිවෙනවා. ගුණයක් නැති මිනිසා වටිනාකමක් නැති කෙනෙක්. ඒ විදියට බැලුවාම මේ ලෝකයේ උතුම්ම තත්ත්වයට පත්වෙන්ට පුළුවන් වන්නේ කෙනෙකු සියළු සසර බැම් බිඳ දැමීමෙන් පමණයි.

ඒ අනුව සෝවාන් මාර්ගය සෝවාන් ඵලය ආදී වශයෙන් ඒ ඒ ගුණයන්ට පත්වෙන අය උතුම් පුද්ගලයන් හැටියට මේ ගාථාවෙන් පෙන්වා දී තිබෙනවා.

බුද්ධ ශ්‍රාවකයන් වූ මේ ආර්ය මහා සංඝ රත්නය ගුණයෙන් පෝෂිතයට සංවරයෙන් අනූනයි. සැදැහැතියන් විසින් පිළියෙළ කරගෙන පූජා කිරීම සඳහා ආහාර පානාදිය ඇතුළු පුද පූජාවක් ලැබීමට අතිශය යෝග්‍ය බවට පත්වී සිටිනවා. සංසාර දුකට පත්වී යා යුතු ගමන් මග තෝරා ගැනීමට අපොහොසත් වන සත්වයාට නිවන් මග සලසා ගැනිමට පුණ්‍ය ක්ෂේත්‍රයක් බඳුයි. මාර්ගෝපදේශකයන් වහන්සේ උන්වහන්සේම යි. ආර්ය මහා සංඝරත්නය තුළ නිරන්තරයෙන් පවතින මේ උතුම් ගුණ බලයෙන් සියලු දෙනාට සහනයක්ම වේවායි කියන උතුම් පැතුම් පැතුමයි. මෙයින් සිදු කර තිබෙන්නේ

ඒ නිසා අද ඔබ උතුම් වු ආර්ය මහා සංඝරත්නයේ ගුණ මෙනෙහි කිරීමෙන් සිදුකර ගත් කුශලානිසංසයෙන් සසර දුකින් තොරව ලබන නිවන සඳහාම හේතු වේවා.

**ඔබ සැමට සම්මා සම්බුදු සරණයි !**